**ශීර්ෂය 294 - ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව**

**-----------------------------------------------------------**

**1.** **මූල්‍ය ප්‍රකාශන**

**----------------**

**1.1** **තත්වාගණනය කළ මතය**

**-----------------------------**

ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්වාගණනය කළ මතය සඳහා පදනම

---

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

---

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදිම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය

සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයා ගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණ මා ප්‍රකාශ කරමි.

(අ) ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශ පිළිබඳ අදහස් දැක්වීම

---------------------------------------

### 1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම

-----------------------------------------------------------------

2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වුවත් එම අවශ්‍යතාවයෙන් බැහැර වූ අවස්ථාවන් පහත දැක්වේ.

| නිරීක්ෂණ | නිර්දේශය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව විසින් අක් මුදල් ගැලපුම් ගිණුම පිළියෙල කර නොතිබුණි. | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 267/2018 හා 2018 නොවැම්බර් 21 දිනැති චක්‍රලේඛය පරිදි කටයුතු කළ යුතුවීම. | ඉදිරි වර්ෂයේදී අදාළ චක්‍රලේඛය අනුව අක් මුදල් ගැලපුම් ගිණුම පිළියෙළ කිරිම සිදුකිරීමට කටයුතු කරන බව. |

### 1.6.2 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය අනුව භාණ්ඩාගාර අග්‍රිම වශයෙන් රු.483,848,000 ක් දක්වා තිබූ නමුත් විගණනයට ඉදිරිපත් කරන ලද මාසික ගිණුම් සාරාංශ හා අනිකුත් | නිවැරදි ලෙස තොරතුරු වාර්තා කළ යුතුවීම. | මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය අනුව භාණ්ඩාගාරය විසින් අග්‍රිම වශයෙන් සත්‍ය ලෙස ලබා දී ඇති රු.483,848,000 ක මුදල දක්වා ඇති අතර ඉතිරි රු.263,000,000 ක මුදල සංවර්ධන අරමුදල මඟින් මාරු කර ගන්නා ලද මුදලකි. |

| | | | |
|---|---|---|---|
| | තොරතුරු අනුව භාණ්ඩාගාර අග්‍රිම වශයෙන් සමාලෝචිත වර්ෂය තුළදී රු.746,790,000 ක් ලැබී තිබූ බව නිරීක්ෂණය විය. | | දෙපාර්තමේන්තුව යටතේ 7042657 හා 7042658 යන ගිණුම් දෙකටම අදාළව එක් අග්‍රිම ගිණුමක් පැවතීම හේතුවෙන් වෙනත් ලැබීම් යටතේ සංවර්ධන අරමුදලෙහි ශේෂය මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයෙහි සඳහන් කිරිම සිදුකර ඇති අතර රු.263,000,000 ක මුදල ද එහි අන්තර්ගත කර ඇත. |
| (ආ) | ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන අනුව සංවර්ධන හා සුභසාධන අරමුදලින් ලැබීම් ලෙස රු.1,008,802,202 ක් දක්වා තිබුණ ද, එම අරමුදලේ ගිණුම් අනුව එම වටිනාකම රු.1,008,194,599 ක් වූයෙන් රු.607,603 ක වෙනසක් නිරීක්ෂණය විය. | විධිවිධාන ප්‍රකාරව තොරතුරු වාර්තා කළ යුතුවීම. | මූල්‍ය ප්‍රකාශනය අනුව අරමුදලින් වෙනත් ලැබීම් ලෙස රු.1,008,802,202 ක් ලෙස ගණනය කිරිම සිදුකර ඇත්තේ 2018 වර්ෂයේ සංවර්ධන අරමුදලට අදාළ මුදල් පොත මඟිනි. |
| (ඇ) | මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ වෙනත් ලැබීම් වශයෙන් රු.1,014,529,096 ක් දක්වා තිබූ නමුත් විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව | වෙනසට හේතු හඳුනා ගෙන නිවැරදිව ගිණුම් ගත කළ යුතුවීම හා මෙවැනි අඩුපාඩු සිදුවීම වළක්වා ගත යුතුවීම. | මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ වෙනත් ලැබීම් වශයෙන් රු.1,014,529,096 ක් සටහන් කර ඇත්තේ සංවර්ධන අරමුදලට අදාළ ලැබීම් වන අතර එලෙස සටහන් කිරීම සිදු නොකළහොත් අග්‍රිම ශේෂය ගැලපීමට නොහැකි |

| | | |
|---|---|---|
| වෙනත් ලැබීම් රු.16,995,542 ක් බව නිරීක්ෂණය විය. | | බව කාරුණිකව දන්වා සිටිමි. ඊට හේතුවනුයේ මෙම ගිණුම් දෙක සඳහාම එක් අග්‍රිම ගිණුමක් පැවතීම බව වැඩිදුරටත් දන්වා සිටිමි. විගණන වාර්තාවේ ඔබ විසින් පෙන්වා ඇත්තේ රජයේ ආදායම් ශිර්ෂයන් සඳහා ලද ලැබීම් හා ගෙවීම් අතර වෙනස වන අතර එම ගැලපීම් වෙනත් ලැබීම් යටතේ හා අග්‍රිම සැසඳීම තුළින් ගලපා ඇති බව. |

**1.6.3** **මූල්‍ය තත්ත්ව ප්‍රකාශය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කර තිබූ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය තුළ දක්වා තිබූ වත්කම් හා වගකීම් අතර රු.2,645,579,202 ක වෙනසක් නිරීක්ෂණය විය. | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය පරිදි කටයුතු කළ යුතුවීම. | 2019 මූල්‍ය වර්ෂය සඳහා ගිණුම් පිළියෙල කිරිමේදී වරද නිවැරදි කිරීමට කටයුතු කරන බව. |
| (ආ) භාණ්ඩාගාර සටහන් අනුව 2018 දෙසැම්බර් 31 දිනට අත්තිකාරම් ගිණුමේ ශේෂය රු.77,354,959 ක් වුවද එය වැරදීමකින් | -එම- | -එම- |

| | | | |
|---|---|---|---|
| | රු.72,354,959 ක් ලෙස හා මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දක්වා තිබුණි. | | |
| (ඇ) | මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුළ දේපළ පිරියත හා උපකරණ ශේෂයට සමාන වටිනාකමක් ශුද්ධ වත්කම් යටතේ සංචිතයක් ලෙස දැක්විය යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි. එසේම අත්තිකාරම් ගිණුමේ ශේෂය හා තැන්පතු ගිණුමේ ශේෂය අතර වෙනස ශුද්ධ වත්කම් ලෙස හඳුනාගෙන නොතිබුණි. | -එම- | -එම- |
| (ඈ) | 2013 ජූලි 12 දිනැති රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ ලිපිය පරිදි නිවැරදිව වත්කම් වර්ගීකරණය කර එක් එක් වත්කමේ වටිනාකම වත්කමේ කේතයට අදාළව නිවැරදිව හඳුනා ගෙන නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස වර්ෂය ආරම්භයේ හා අවසානයේ වත්කම්වල මුළු වටිනාකම පමණක් ජංගම වත්කම් ප්‍රකාශය තුළ දක්වා තිබුණි. | චක්‍රලේඛය පරිදි කටයුතු කළ යුතුවීම. | 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනය මඟින් මෙම වරද නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. |
| (ඉ) | භාණ්ඩාගාරයේ පොත් හා දෙපාර්තමේන්තුවේ ගිණුම්වල මූල්‍ය නොවන වත්කම්වල ආරම්භක ශේෂයන් පිළිවෙලින් රු.4,383,908,211 ක් හා | වෙනසට හේතු හඳුනා ගෙන නිවැරදිව ගිණුම් ගත කළ යුතුවීම. | 2019 වර්ෂයේදී මෙය නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු මේ වනවිට සිදුකරමින් පවතින බව. |

| | | | |
|---|---|---|---|
| | රු.2,446,564,947 ක් වූයෙන් භාණ්ඩාගාරයේ ගිණුම්වල මූල්‍ය නොවන වත්කම් ශේෂය රු.1,937,343,264 ක් වැඩියෙන් දක්වා තිබුණි. එසේම භාණ්ඩාගාරයේ වත්කම් වාර්තාවලට අනුව එක් එක් අනු කේතය යටතේ ආරම්භක ශේෂ දක්වා තිබූ නමුත් දෙපාර්තමේන්තුවේ ගිණුම්වල එසේ එක් එක් අනු කේතය යටතේ එක් එක් වත්කමට අදාළව ශේෂ හඳුනාගෙන නොතිබුණි. | | |
| (ඊ) | භාණ්ඩාගාරයේ වත්කම් වාර්තාවලට අනුව වර්ෂය තුළ වටිනාකම රු.210,686,869 ක මූල්‍ය නොවන වත්කම් මිලදී ගැනීම් ලෙස දක්වා තිබුණු අතර දෙපාර්තමේන්තු ගිණුම් අනුව එම වටිනාකම රු.217,897,402 ක් වූයෙන් රු.7,210,533 ක් වැඩියෙන් දෙපාර්තමේන්තු පොත්වල මිලදී ගැනීම් ගිණුම් ගත කර තිබුණි. | වෙනසට හේතු හඳුනා ගෙන නිවැරදිව ගිණුම් ගත කළ යුතුවීම. | 2019 වර්ෂයේදී මෙය නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු මේ වනවිට සිදුකරමින් පවතින බව. |
| (උ) | භාණ්ඩාගාරයේ පොත් හා දෙපාර්තමේන්තුවේ ගිණුම්වල මූල්‍ය නොවන වත්කම්වල අවසාන ශේෂයන් පිළිවෙලින් රු.4,593,931,985 ක් හා | වෙනසට හේතු හඳුනා ගෙන නිවැරදිව ගිණුම් ගත කළ යුතුවීම. | 2019 වර්ෂයේදී මෙය නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු මේ වනවිට සිදුකරමින් පවතින බව. |

| | | |
|---|---|---|
| රු.2,664,462,349 ක් වූයෙන් රු.1,929,469,636 ක වෙනසක් නිරීක්ෂණය විය. | | |
| (උ) වර්ෂය තුළ රු.663,095 ක් වටිනා වත්කම් අපහරණය කර තිබූ බව භාණ්ඩාගාරයේ වත්කම් වාර්තාව පරීක්ෂාවේදී නිරීක්ෂණය වූ නමුත් ඒ බවට කිසිදු සටහනක් දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන තුළ නොවීය. | වෙනසට හේතු හඳුනා ගෙන නිවැරදිව ගත කළ යුතුවීම. | 2019 වර්ෂයේදී මෙය නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු මේ ගිණුම් වනවිට සිදුකරමින් පවතින බව. |

### 1.6.4 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

----------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුළ රු.743,145,952 ක් දක්වා තිබූ නමුත් විගණනයට ඉදිරිපත් කරන ලද මාසික ගිණුම් සාරාංශ හා අනිකුත් තොරතුරු අනුව එම වටිනාකම රු.1,819,037,840 ක් | මුදල් ප්‍රවාහ ප්‍රකාශය මාසික ගිණුම් සාරාංශ හා භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සමඟ සසඳා නිවැරදිව පිළියෙල කළ යුතුය. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කිරීමේදී මුදල් පදනම අනුව හරස් සටහන් ලැබීම් නොසලකා මුදලින් ලද බැර කිරීම් පමණක් සැලකිල්ලට ගෙන පිළියෙල කිරීම සිදුකර ඇති බව හා තැන්පතු ගිණුම යටතේ මුදලින් ලද රු.7,574,836 ක මුදල මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය ලෙස සටහන් කරන ලද රු.743,145,952 ක මුදල තුළ අන්තර්ගත බව. |

| | | | |
|---|---|---|---|
| | විය. ඒ අනුව රු.1,075,891,888 ක වෙනසක් නිරීක්ෂණය විය. | | |
| (ආ) | ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ කිසිවක් සඳහන් කර නොතිබුණු නමුත් විගණනයට ඉදිරිපත් වූ මාසික ගිණුම් සාරාංශ හා අනෙකුත් තොරතුරු අනුව අත්තිකාරම් ආපසු අයකර ගැනීම් රු.20,444,357 ක් විය. | වටිනාකම් නිවැරදිව හඳුනාගෙන නියමිත පරිදි වාර්තා කළ යුතුවීම. | ආයෝජන ක්‍රියාකාරම්වලින් ජනිත වූ මුදල් කිසිවක් නොමැති වූ බැවින් මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය තුළ එය සටහන් කිරීම සිදු නොකරන ලද අතර විගණන වාර්තාවේ අත්තිකාරම් ආපසු අයකර ගැනීම් ලෙස රු.20,444,357 ක් ලෙස දක්වා ඇත්තේ අත්තිකාරම් බී ගිණුම සඳහා හරස් සටහන් සහිත ලැබීම් වන බව. |
| (ඇ) | තැන්පත් ගිණුම් හා අනිකුත් වගකීම්වල වෙනස්වීම් වශයෙන් රු.67,720 ක් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුල දක්වා තිබූ නමුත් මූල්‍ය ක්‍රියාකාරකම්වලින් කිසිදු මුදලක් ජනිත වී නොතිබුණු බව විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව නිරීක්ෂණය විය. | -එම- | තැන්පත් ගිණුම් හා අනෙකුත් වගකීම්වල වෙනස් වීම් වශයෙන් දක්වා ඇත්තේ පොදු තැන්පත් හා ණය ගිණුමෙහි ශේෂයන් අතර වෙනස වූ රු.67,720 ක මුදලක් වන අතර ඉදිරි ගිණුම මඟින් එය නිවැරදි කිරීමට කටයුතු කරන බව. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැයකළ මුදල ලෙස රු.447,085,545 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ සඳහන් කර තිබූ නමුත් විගණනයට ඉදිරිපත් වූ මාසික ගිණුම් සාරාංශ හා අනිකුත් තොරතුරු අනුව එම වටිනාකම රු.1,506,981,188 ක් විය. ඒ අනුව රු.1,059,895,643 ක වෙනසක් නිරීක්ෂණය විය. | -එම-. | මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කළ මුදල රු.447,085,541 ක් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශය ලෙස සටහන් කර ඇත්තේ පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් සඳහා මුදලින් දරා ඇති වියදම් වන බව හා විගණන වාර්තාවේ සටහන් කර ඇති ශේෂය දෙපාර්තමේන්තුව විසින් භාණ්ඩාගාරය වෙත පියවන ලද අග්‍රිමයක් නොවන අතර දෙපාර්තමේන්තුව සතු සංවර්ධන අරමුදල මඟින් රජයේ ඇස්තමේන්තුවෙහි වියදම් දැරීම සඳහා මාරු කරන ලද මුදල් ප්‍රමාණය බව. |
| (ඉ) | මුදල් ප්‍රවාහ ප්‍රකාශය අනුව වර්ෂය තුළ රු.296,128,127 ක් භෞතික වත්කම් ඉදිකිරීම් හා මිලදී ගැනීම් වෙනුවෙන් ආයෝජනය කර ඇති බව දක්වා තිබුණද මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශය අනුව මිලදී ගැනීම් ලෙස රු.217,897,402 ක් පමණක් දක්වා තිබුණි. ඒ අනුව රු.78,230,725 ක වෙනසක් නිරීක්ෂණය විය. | වෙනසට හේතු හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවීම. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය අග්‍රිමය හා සැසඳීම සිදුකළ යුතු වූ බැවින් එහි සටහන් කර ඇත්තේ වර්ෂය තුළ ප්‍රාග්ධන වියදම් සඳහා මුදලින් දරා ඇති සම්පූර්ණ වියදම වන අතර මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශය තුල සටහන් කර ඇත්තේ වත්කම් මිලදී ගැනීම සඳහා දරා ඇති වියදම බව. |

### 1.6.5. ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| **(අ) ඇප ලේඛනය** | | |
| මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරීන් හා සේවකයන්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 891(1)හි සඳහන් තොරතුරු ඇතුළත් වන පරිදි ඇප තැබිය යුතු නිලධාරීන් පිළිබඳ ඇප ලේඛනයක් පවත්වා ගත යුතුවීම. | ඉදිරියේ මෙම ලේඛනය පිළියෙල කිරීමට කටයුතු කරන බව. |
| **(ආ) විදුලි උපකරණ පිළිබඳ ලේඛනය** | | |
| මුදල් රෙගුලාසි 454(2) ප්‍රකාරව විදුලි උපකරණ පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි 454(2) හි සඳහන් පරිදි රජයේ ගොඩනැගිලිවල සියළුම විදුලි උපාංග හා උපකරණ පිළිබඳ බඩු ලේඛන පොතක් පවත්වා ගත යුතුවීම. | ප්‍රධාන ගබඩාවන්හි මේ සඳහා වෙනම ලේඛන පවත්වා ගෙන යන අතර අවශ්‍ය නම් ඉදිරියේදී යන්ත්‍රෝපකරණ අගය කිරීම සඳහා පත් කර ඇති කමිටු වාර්තා ලද පසු විදුලි උපකරණ ලේඛනයක් වෙනම පිළියෙල කිරීමට කටයුතු කිරීමට හැකි බව. |

(ඇ) **වාහන ලොග් පොත**

| | | |
|---|---|---|
| මුදල් රෙගුලාසි 1645(අ) ප්‍රකාර වාහන ලොග් පොත් පවත්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි 1645(අ) හි දැක්වෙන විධිවිධාන ප්‍රකාරව පොදු 267 අකෘතිය ප්‍රකාරව වාහන ලොග් පොත් සෑම වාහනයක් සම්බන්ධයෙන්ම පවත්වා ගත යුතුවීම. | ඉදිරියේ වාහන ලොග් පොත් යාවත්කාලීන කර පවත්වා ගෙන යාමට කටයුතු කරන බව. |

## 1.6.6. ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| නිරීක්ෂණය | නිර්දේශය | දෙපාර්තමේන්තුවේ අදහස් දැක්වීම |
|---|---|---|
| දෙපාර්තමේන්තුව මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු විය. එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. | මේ සම්බන්ධයෙන් නිසි දැනුවත්කමක් නොමැතිවීම හේතුවෙන් අදාල සමාලෝචනය ලිඛිතව සිදු කිරීමට නොහැකි විය. |

## 1.6.7. නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

------------------------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නිරීක්ෂණය ------------ නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | | | |
| (i) 1992 අගෝස්තු 19 දිනැති හා අංක 25/99 | දෙපාර්තමේන්තුව සතු සංචිත වාහන 04 ක රාජ්‍ය ලාංඡන යොදා නොතිබුණි. | 1992 අගෝස්තු 19 දිනැති හා අංක 25/99 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය පරිදි කටයුතු කළ යුතුවීම. | ඉදිරියේදී දෙපාර්තමේන්තුව සතු වාහන සඳහා රාජ්‍ය ලාංඡනය භාවිතා කිරීමට කටයුතු කරන බව. |
| (ii) 2006 දෙසැම්බර් 26 දිනැති අංක 30/2006 | වාහන නඩත්තුව, ඉන්ධන පරිභෝජනය, ලොග් සටහන් හා ධාවන සටහන් පවත්වා ගැනීම හා ඉන්ධන කාර්යක්ෂමතාව මැන බැලීම යනාදී කරුණු සම්බන්ධයෙන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | 2006 දෙසැම්බර් 26 දිනැති හා අංක 30/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතුවීම. | ඉදිරියේදී 2006 දෙසැම්බර් 26 දිනැති හා අංක 30/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව වාහන සම්බන්ධයෙන් කටයුතු කරන බව. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 වියදම් කළමනාකරණය

වාර්ෂික අයවැය දෙපාර්තමේන්තුව අනුව සිදු කරන ලද ප්‍රතිපාදනවල ඉතිරිවීම් සම්බන්ධයෙන් නිරීක්ෂණය වූ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වැය විෂයන් හතරක් සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනවලින් සියයට 28 සිට සියයට 75 දක්වා පරාසයක ඉතිරිවීම් නිරීක්ෂණය විය. | ඇස්තමේන්තු නිවැරදිව හා තාත්විකව පිළියෙල කළ යුතුවීම. | ඇස්තමේන්තු පිළියෙළ කිරීම මුදල් රෙගුලාසි 50 ට අනුකූලව සකස් කර ඇතත් මහා භාණ්ඩාගාරය විසින් ප්‍රමාණවත් පරිදි අක් මුදල් ලබා නොදීම මෙම ප්‍රතිපාදන ඉතිරිවීම කෙරෙහි මූලිකවම බලපා ඇත. ඇතැම් ඉදිකිරීම්හි සැලසුම් සකස් කිරීමත්, ප්‍රසම්පාදන කටයුතු සඳහා දීර්ඝ කාලසීමාවක් ගත වීමත් හා ඉදිකිරීම් ආයතන විසින් නියමිත කාලය තුල බිල්පත් ඉදිරිපත් නොකිරීමත් ප්‍රතිපාදන ඉතිරිවීම් සඳහා බලපෑ අනෙකුත් හේතූන් වේ. |

**2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| මුදල් රෙගුලාසි 94 ප්‍රකාරව යම් දෙපාර්තමේන්තුවක් ප්‍රතිපාදන ඉක්මවා බැරකම්වලට බැඳීමට ඉඩ නොදිය යුතු වුත් වැය විෂයයන් 09 කට අදාළව ඉතිරිවීම් ඉක්මවා රු.8,894,929 ක බැරකම්වලට එළඹ තිබුණි. | මුදල් රෙගුලාසි 94 පරිදි කටයුතු කළ යුතුවීම. | දෙපාර්තමේන්තුව විසින් සිදුකල යුතු වූ අත්‍යාවශ්‍ය ගෙවීම් හේතුවෙන් ප්‍රතිපාදන සීමාව ඉක්මවා බැරකම්වලට එළඹීමට සිදුවූ බව කාරුණිකව දන්වා සිටින අතර ඉදිරියේදී මෙය හැකිතාක් දුරට අවම කර ගැනීමට කටයුතු කරන බව වැඩිදුරටත් දන්වා සිටිමි. |

**2.3 තැන්පතු ශේෂයන්**

පහත සඳහන් නිරීක්ෂණය සිදු කෙරේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| වටිනාකම රු.18,848,170 ක් වූ තැන්පතු අදාළ ගිණුම්වලට බැර නොකර වර්ෂ 02 සිට වර්ෂ 05 දක්වා කාලයක් පොදු තැන්පතු ගිණුමේ රඳවා තබා තිබුණි. | වර්ෂ 02 ක ඉක්මවූ සියළු තැන්පතු රජයේ ආදායමට බැර කළ යුතුවීම. | 2018 වර්ෂයේ සිට යාවත්කාලීන කර පවත්වා ගෙන යන බව. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව විසින් 2018 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට නියමිත ව්‍යාපෘති පහකට අදාළව රු.මිලියන 184 ක් වෙන් කර තිබූ නමුත් අපේක්ෂිත ප්‍රතිඵලය අත්පත් කර නොගැනීම හේතුවෙන් වර්ෂය අවසන් වන විට ඉන් රු.මිලියන 124.88 ක් ඉතිරි වී තිබුණි. | ව්‍යාපෘති හැකිතාක් ඉක්මනින් නිම කර අපේක්ෂිත ප්‍රතිලාභ ලබාගැනීමට කටයුතු කිරීම | පොදුවේ ගත් කල සත්වෝද්‍යානයන්ට ගැලපෙන පරිදි සැලසුම් සකස් කිරීම සඳහා යම් කාලසීමාවක් ගත වීමත්, සැලසුම් සකස් කළ පරිදි ඇතැම් ව්‍යාපෘතීන් නිම කිරීමට නොහැකිවූයේ ලංසු කැඳවීම සිදුකළත් ඒවා විවිධ හේතු මත ප්‍රතික්ෂේප වීම හේතුවෙන් නැවත මිල කැඳවීමට සිදුවීමත් මහා භාණ්ඩාගාරය විසින් අක් මුදල් ලබා දීමේ ප්‍රමාදයත් හේතුවෙන් බව වැඩිදුරටත් දන්වා සිටිමි. |

## 3.2 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ඇස්තමේන්තුගත වටිනාකම රු.මිලියන 202.7 ක් වූ ව්‍යාපෘති 06 ක් අදාළ කොන්ත්‍රාත් සමාගමේ ප්‍රමාදයන් හේතුවෙන් 2018 වර්ෂය අවසන් වන විට නිම නොකර අත්හැර දමා තිබූ අතර ඒ සඳහා වර්ෂය අවසන් වන විට රු.මිලියන 89 ක වියදම් දරා තිබුණි. | ව්‍යාපෘති අත්හැර දැමීමෙන් රජයට සිදුවූ අලාභය අයකර ගැනීමට හා නැවත එම ව්‍යාපෘති කඩිනමින් ආරම්භ කිරීමට කටයුතු කළ යුතුවීම. | එම ආයතනයේ සිදුවූ පරිපාලනමය ගැටලුවක් හේතුවෙන් ඉදිකිරීම් කටයුතු ප්‍රමාද වීමක් සිදුව තිබිණි. කෙසේ නමුත් මේ වනවිට එම ඉදිකිරීම් කටයුතු එම ආයතනය විසින් නැවත ආරම්භ කර ඇති බව. |

## 3.3 වෙනත් නිරීක්ෂණ

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| Food Cutter & Garbage Crusher මිලදී ගැනීම සඳහා රු.මිලියන 12.5 ක ප්‍රතිපාදන සලසා තිබූ නමුත් වර්ෂය අවසානය වන තෙක් එම මිලදී ගැනීම් සිදු කර නොතිබුණි. | ක්‍රියාකාරී සැලැස්මට අනුව කටයුතු කළ යුතුය. | පෙර සැලසුම් සකස් කරන ලද යන්ත්‍රයම මිලදී ගැනීම සඳහා මේ වන විට අදාළ ප්‍රමාණපත්‍ර සැකසීමේ කටයුතු උපදේශන සමාගම සිදුකරනු ලබන බව. |

**3.4 ප්‍රසම්පාදනයන්**

**----------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| (අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.2 වගන්තිය ප්‍රකාරව ලංසු කැඳවීමේදී හැකි සෑම අවස්ථාවකම අදාළ වෙබ් අඩවිවල පළ කළ යුතු නමුත් පශු වෛද්‍ය උපකරණ මිලදී ගැනීම සඳහා කැඳවන ලද ලංසු කැඳවීම් දැන්වීම ජාතික පුවත්පත්වල පමණක් පළ කර තිබුණි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් මේ සඳහා ප්‍රමාණවත් තරම් ලංසු සංඛ්‍යාවක් ඉදිරිපත් කර නොතිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කර හැකිතාක් තරඟකාරී මිල කැඳවීමක් සිදුකළ යුතුවීම. | මෙම පශු වෛද්‍ය උපකරණ ශ්‍රී ලංකාව තුළ භාවිතය අවම මට්ටමක පැවතීම හේතුවෙන් මෙම පශු වෛද්‍ය උපකරණ සැපයුම්කරුවන් ද ශ්‍රී ලංකාව තුල අවම මට්ටමක පැවතීම, අවම ලංසු සංඛ්‍යාවක් ලැබීමට මූලික හේතුව වූ අතර වෙබ් අඩවිවල දැන්වීම් පල කිරීම දෙපාර්තමේන්තුව විසින් සාමාන්‍ය වශයෙන් සිදුනොකරයි. |
| (ආ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.9.2 පරිදි ප්‍රතිචාරාත්මක ලංසුව සෑහෙන අන්තිකයකින් අදාළ බලධාරියාගේ ඇස්තමේන්තුව ඉක්මවන්නේ නම් අධික පිරිවැයට හේතු කවරේදැයි ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් | -එම-. | වෙළඳපල මිල පිළිබඳ අවබෝධයක් නොතිබීම නිසා නිවැරදි මිල ඇස්තමේන්තුවක් පිළියෙල කළ නොහැකි වීමට සිදුවූ බව. |

| | | | |
|---|---|---|---|
| | විමර්ෂණය කර අළුතින් ලංසු කැඳවීම සඳහා සලකා බැලිය යුතුය. එසේ වුවද ඉහත 3.4 (අ) ඡේදයේ සඳහන් මිලදී ගැනීම සඳහා එවැනි සැසඳීමක් සිදු කිරීම සඳහා මිලදී ගනු ලබන භාණ්ඩ සම්බන්ධයෙන් මිල ඇස්තමේන්තුවක් පිළියෙල කර නොතිබුණි. | | |
| (ඇ) | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මේ වටිනාකම රු.මිලියන 12.5 කට ඇස්තමේන්තු කර තිබූ වෛද්‍ය උපකරණ මිලදී ගැනීම සඳහා ලද ලංසු අනුව රු.මිලියන 26.8 ක් සත්‍ය වශයෙන් වැය වී තිබුණද මෙම පිරිවැය විචලතාවය පිළිබඳ විමර්ෂණයක් කිරීමට කටයුතු කර නොතිබුණි. | -එම- | මෙම උපකරණ මිලදී ගැනීම පළමු වතාවට සිදු කළ අතර මෙම උපකරණ ශ්‍රී ලංකාව තුල භාවිතය ඉතා අඩු වීම නිසා මේ සඳහා වෙළඳපොලක් නොමැත. එබැවින් වාර්ෂික ප්‍රසම්පාදන සැළැස්මේ වටිනාකම ඉක්මවා ගිය නමුත් මෙම ප්‍රසම්පාදන කටයුතු මඟින් උසස් ගුණත්වයකින් යුත් භාණ්ඩ හැකිතාක් අවම පිරිවැයකින් ලබා ගැනීමට හැකි වූ බව. |

## 3.5 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් කළමනාකරණ දුර්වලතා නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) පින්නවල අලි අනාථාගාරයේ අප ජලය පිටවීම සඳහා විධිමත් කාණු පද්ධතියක් ඉදිකර නොතිබූ බැවින් කිසිදු පිරිපහදු කිරීමකින් තොරව අසල පිහිටි ගඟට අප ජලය මුදා හැර තිබුණි. | විධිමත් කාණු පද්ධතියක් ඉදි කිරීමට කටයුතු කළ යුතුවීම. | අලි මඩු පිරිසිදු කිරීමේ දී පිට වන අපජලය නිදහස් ජල මුලාශ්‍රවලට එක්වීම වැළක්වීමට අපජල පිරිපහදු පද්ධතියක් (waste water treatment plant) සියලු අලි පන්ති හා අලි මඩු සම්බන්ධ කරගනිමින් ඉදිවෙමින් පවතී. |
| (ආ) පින්නවල අලි අනාථාගාරයේ මෙම අලින් රඳවා සිටින ස්ථාන ආසන්නයෙන් අලි වසුරු හා ඉතිරි වූ ආහාර කොටස් ගොඩ ගසා තිබූ බැවින් පරිශ්‍රය අපවිත්‍රව පැවතුණි. | අලි වසුරු ප්‍රතිචක්‍රීකරණය කිරීමට කටයුතු කළ යුතුවීම. | අපද්‍රව්‍ය අඹරා කුඩා කොටස්වලට වෙන් කළ හැකි යන්ත්‍රයක් සවි කිරීම සඳහා ප්‍රසම්පාදන කටයුතු කරමින් පවතින බව. |

## 4. තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දෙපාර්තමේන්තුව විසින් තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්කයන් හඳුනාගෙන තිබුණද ඒවා ළඟා කර ගැනීමට හැකිවන අයුරින් ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබූ අතර මේ සම්බන්ධයෙන් කිසිදු ප්‍රගතියක් ලබා නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්කයන් ළගා කර ගැනීමට හැකිවන අයුරින් ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කළ යුතුවීම. | තිරසර සංවර්ධන අරමුණු 15 ට අනුව සංරක්ෂණ කටයුතු වැඩිදියුණු කිරීම සඳහා සංරක්ෂණ මධ්‍යස්ථාන ඉදි කිරීම, අරමුණු හතට අනුව සූර්ය බල තාපක ඉදි කිරීම, අරමුණු හයකට අනුව වැව් තැනීම, අරමුණු එකට අනුව දිළිදු බව තුරන් කිරීම සඳහා අසල්වැසි භෝග අලෙවිය සඳහා අවස්ථා සලසා දීම, අරමුණු දොළහකට අනුව කසළ ප්‍රතිචක්‍රීයකරණය සිදු කිරීම ආදීය දෙපාර්තමේන්තුව මඟින් සිදු කරන බව කාරුණිකව දන්වා සිටිමි. එමෙන්ම මේ කරුණු ක්‍රියාකාරී සැලැසුමේ අන්තර්ගතව ඇති බව. |

## 5. යහපාලනය

### 5.1 අභ්‍යන්තර විගණනය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40.4 වන වගන්තිය ප්‍රකාරව සියලු අභ්‍යන්තර විගණන වාර්තා පිටපත් කළමනාකරණ | 2018 අංක 19 දරන ජාතික විගණන පනත අනුව කටයුතු කළ යුතුවීම. | 2018 අංක 19 දරණ විගණන පනතේ 40(4) වන වගන්තිය අනුව 2019 වර්ෂයේ සිට අභ්‍යන්තර විගණන වාර්තාවල මෘදු පිටපත් කළමනාකරණ විගණන |

| | |
|---|---|
| විගණන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු වුවත් එසේ කටයුතු කර නොතිබුණි. | දෙපාර්තමේන්තුවේ උපදෙස් පරිදි යැවීමට කටයුතු කරන බව. |

**6.** **මානව සම්පත් කළමනාකරණය**

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ පුරප්පාඩු තනතුරු 169 ක් වූ අතර ඉන් ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 06 ක හා ද්වීතික මට්ටමේ තනතුරු 40 ක් පුරප්පාඩු පැවතීම හේතුවෙන් දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් කාර්යක්ෂමතාවය අවම මට්ටමක පැවතුණි. | පුරප්පාඩු පිරවීමට අවශ්‍ය කටයුතු සිදු කළ යුතුවීම. | ප්‍රාථමික ශ්‍රේණියේ නිලධාරීන් 32 ක් 2019 අප්‍රේල් මාසයේදී බඳවා ගැනීම් සිදුකර ඇති අතර ඉතිරි තනතුරු සඳහා බඳවා ගැනීම් කිරීමට අවශ්‍ය කටයුතු මේ වන විට සිදුකරමින් පවතී. |